# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1952/5 - 2016 පෙබරවාරි මස 01 වැනි සඳුදා - 2016.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනත සමග කියවෙන 563 වන අධිකාරිය වන පොදු සුසාන හා පෞද්ගලික සුසාන භූමි ආඥාපනතේ 05 වන වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහනුවර මහා නගර සභාවේ 2015.10.14 දින අංක 8(54) දරන සභා සම්මුතිය මගින් පොදු සුසාන භූමියක් ලෙස පිළිගෙන ඇති මෙහි උපලේඛන අංක 01 හි සඳහන් මායිම් තුළ පිහිටි දොඩම්වල සුසාන භූමිය මින් ඉදිරියට මහනුවර මහා නගර සභාව සතු පොදු සුසාන භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරමි.

තවද එකී දොඩම්වල සුසාන භූමියේ ආදාහනය හා භූමිදානය කළ හැකි අභාවයන් ඇතුළත් ප්‍රදේශ මෙහි II වන උපලේඛනයෙහි දක්වා සිටිනු ලැබේ.

සරත් ඒකනායක,<br>
මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍ය සහ<br>
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2016 ජනවාරි මස 20 වැනි දින.

### උපලේඛන I

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 1991.08.22 දිනැතිව කරන ලද මූලික පිඹුර මහ 3858 හි කැබලි අංක 01 වන මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, මහනුවර මහා නගර සභාවේ අංක 05 දරන නුවර දොඩම්වල කොට්ඨාසයේ, නුවර දොඩම්වල ගමේ පිහිටි ඉඩමට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | - | දොඩම්වල පටු මාවත හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | - | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| දකුණට | - | මෙම ඉඩමේ ඉතිරි කොටස හා පීල්ල ගාව වත්ත ; |
| බටහිරට | - | දොඩම්වල පටු මාවත තුළ පිහිටි හෙක්ටයාර් 0.1633 වපසරියකින් යුත් බිම් කොටස වේ. |

### උපලේඛන II

| | | |
|---|---|---|
| උතුරට | - | මහවැලි ගඟ හා ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත ; |
| නැගෙනහිරට | - | මහනුවර කටුගස්තොට මාර්ග සංවර්ධන අධිකාරියට සතු මාර්ගය හා අස්ගිරිය ශ්‍රී සුමංගල මාවත වට්ටාරන්තැන්න පාර, අනිවත්ත පාර, ජෝර්ජ් ඊ ද සිල්වා මාවත ; |
| බටහිරට | - | මහවැලි ගඟ හා ගැටඹේ - ගන්නෝරුව මාර්ග සංවර්ධන අධිකාරිය සතු පාර ; |
| දකුණට | - | මහනුවර පේරාදෙණිය පැරණි මාර්ගය. |

02 - 445

1A - PG 2819 — 106 (2016/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*